# කැලණිය අධ්‍යාපන කලාපය
## දෙවන වාර පරීක්ෂණය
### නාට්‍ය හා රංග කලාව - 2016

11 ශ්‍රේණිය I

කාලය:- පැ. 1

නම:- ..............................................................................................

- **ප්‍රශ්න 40 යටම පිළිතුරු සැපයිය යුතුයි.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

**01. 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පහත සංවාදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

A - ආල වේලා පියසේ පටන් - මම -
කෝල නැතිව සබයේ මෙදැන්

B - විභාගේ විභාගේ කොහි බැලුවත් විභාගේ
විභාගේ තමා අපේ අභාගේ

C - අත්තක පිපි මලක් ලෙසින්- පෙත්තක ඇඳි ඉරක් ලෙසින්
සත්තක මගේ පුතුගේ යසේ - නෙත්දෙක ඇර බලන් මෙසේ

D - නැත පියාණනි කිසිදු මනදොළ
සමා උව මැන දොසක් වී නම්
වෙසෙන සඳ මේ පාළු ලෙන තුල
නෙක් දිසා සිත පියාඹා යයි

01. ඉහත සංවාද ඛණ්ඩ ඇසුරින් පහතරට ශාන්ති කර්මයක් පිළිබඳ කියැවෙන පද්‍ය වන්නේ,
(1) A (2) B (3) C (4) D

02. වෙස් මුහුණු භාවිතා කරමින් ලංකාවේ පහතරට ප්‍රදේශයේ රඟ දැක්වුගැම් නාටකය නියෝජනය වන පද්‍ය ඛණ්ඩය වන්නේ,
(1) A (2) B (3) C (4) D

03. නාට්‍ය ධර්මී ශෛලියට අයත් නාට්‍ය ඛණ්ඩය වන්නේ,
(1) A (2) B (3) C (4) D

04. සෝමලතා සුබසිංහ මහත්මිය අධ්‍යක්ෂණය කළ නාට්‍යයක පද්‍ය කොටස වන්නේ,
(1) A (2) B (3) C (4) D

05. පිළිවෙලින් ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී ශෛලීන් වල පද්‍ය කොටස් දෙක වන්නේ,
(1) A හා B (2) B හා D (3) A හා D (4) B හා C

- **6 සිට 10 දක්වා ප්‍රශ්නවලට පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| පත්තිනි<br>නල දමයන්ති<br>සෝමලතා සුබසිංහ | ආර්.ආර් සමරකෝන්<br>අඹවිදමන<br>උඩරට නැටුම් | සොකරි<br>දෙවොල්<br>රාමා මැරීම | ජයලත් මනෝරත්න<br>භරත නාට්‍ය<br>පරයා |

06. පහතරට ශාන්තිකර්ම වලදී පුද ලබන දෙවිවරු ඇතුළත්ව ඇත්තේ,
(1) C හා A (2) B හා C (3) A හා C (4) A හා B

07. දේශීය ගැමි නාටක චරිත ඇතුළත් වන්නේ,
(1) C හා D (2) A හා B (3) C හා B (4) D හා A

08. විකෘති නාට්‍යයේ අධ්‍යක්ෂක ඇතුලත්ව ඇත්තේ,
(1) A (2) B (3) C (4) D

09. නෘත්‍ය ලක්ෂණ අඩංගුව ඇති නර්තන අංග ඇතුලත්ව ඇත්තේ,
(1) C හා D (2) A හා D (3) B හා C (4) A හා B

10. මඩු ශාන්තිකර්මවල නාට්‍යමය ලක්ෂණ අඩංගු වන්නේ,
(1) B හා A (2) C හා D (3) B හා C (4) A හා B

11. පරයා, ආඬිගුරා, වෙදරාළ යන චරිත ඇතුළත් චරණය වන්නේ,
(1) සොකරි (2) කෝලම් (3) කවි නාඩගම් (4) නාඩගම්වලය

12. නාට්‍යයක සාහිත්‍යමය කොටස ඇතුළත් වන්නේ,
(1) වේදිකා අලංකරණයෙහි (2) පෙළෙහිය.
(3) නළුවරණයෙහිය (4) නාට්‍ය සංගීතයේය

13. සමාරෝපය යනු,
(1) රංග භූමි පාලක සතු කාර්යයකි
(2) බාහිර හා අභ්‍යන්තර ලෙස ප්‍රභේද 2 කි.
(3) සාර්ථක රංගනයක් සඳහා අත්‍යාවශ්‍ය දෙයකි
(4) සමාන ලෙස ආරූඪ වීමය

14. අභිරූපන රංගයේදී දක්නට නොලැබෙන අභිනය වන්නේ,
(1) වාචික අභිනයයි (2) සාත්වික අභිනයයි
(3) ආහාර්ය අභිනයයි (4) ආංගික අභිනයයි

15. විකෘති හා කාලගෝල නාට්‍ය අයත් වන්නේ,
(1) ශෛලිගත හා ශෛලිගතු (2) අසම්මත හා තාත්වික
(3) තාත්වික හා ශෛලිගත (4) අසම්මත හා විකාර රූපි

16. ප්‍රධාන අංග රචනා ක්‍රම 2 වන්නේ,
(1) සෘජු අංග රචනය හා මුහුණ අංගරචනය
(2) සෘජු අංග රචනය හා චරිතාංග අංගරචනය
(3) චරිතාංග අංගරචනය හා මුහුණ අංගරචනය
(4) මුහුණ අංගරචනය හා ශරීරයඅංගරචනය

17. රංග රචනයේදී වර්ණ ගැලපිය යුත්තේ
(1) රංගලෝකයට හා රංග වස්ත්‍රවලට (2) රංගභූමි අලංකරණයට හා පිටපතට
(3) රංග වස්ත්‍රයට හා සංගීතයට (4) සංගීතයට හා රංග වින්‍යාසයට

18. ප්‍රාසාංගික කලාවට අයත් නොවන්නේ,
(1) නාට්‍යය (2) නැටුම් (3) ගීතය (4) චිත්‍රය

19. ප්‍රධාන ආලෝක පහන් වලට අයත් නොවන්නේ,
(1) ධාරාලෝක පහන් (2) වර්ණ චක්‍රය
(3) යොමු පහන් (4) ඩිමරය

20. පිටපතකින් තොරව සීමිත කාලයක් තුල දෙන ලද ඉඟියකට අනුව කිසියම් අවස්ථාවක් නිරූපනය කිරීම.
(1) අභිරූපනයයි (2) භූමිකා රංගනයයි (3) ක්ෂණික රූපනයයි (4) අනුකරනයයි


21. අනුශාංගික කලාවන්ට අයත් නොවන්නේ,
(1) රංගාලෝකය (2) සංගීතය (3) රංගවින්‍යාසය (4) දෙබස් උච්චාරණය

★ **22 සිට 30 දක්වා ප්‍රශ්නවලට පින්තූරය බලා පිළිතුරු සපයන්න.**


22. දකුණුපස රූපයේ දැක්වෙන නෘත්‍යාංගය වන්නේ,
(1) බැලේ
(2) මුද්‍රා නාට්‍ය
(3) ඔපෙරා
(4) භරත නැටුම්



23. මෙම රංග භූමිය ............. ලෙස හඳුන්වයි.
(1) තානායම් පොළ
(2) සබය
(3) කරලිය
(4) පින්තූර රාමු වේදිකාව



24. දකුණුපස ඡායාරූපයේ දැක්වෙන්නේ,
(1) යොමු පහනක්
(2) ධාරා ලෝක පහනක්
(3) ඩිමරයකි.
(4) වර්ණ චක්‍රයකි



25 මෙම රූපයේ දැක්වෙන නාට්‍යකරුවා වන්නේ,
(1) ආර්.ආර් සමරකෝන්ය
(2) හෙන්රි ජයසේනය
(3) සුගතපාල ද සිල්වාය
(4) එදිරිවීර සරච්චන්ද්‍රයන්ය



26. මෙම වෙස් මුහුණ
(1) පොලිස් කෝලම
(2) නොන්චි කෝලම
(3) මුදලි කෝලම
(4) ජෝවා කෝලම



27. මෙම පින්තූරය අයත් නාට්‍ය වන්නේ,
(1) කඳා වළලු
(2) නරිබෑනා
(3) විකෘති
(4) දික්තල කාලගෝල




28. රිද්දියාගේ එන නාට්‍යමය ලක්ෂණයකි.
(1) නානුමුරය
(2) දරු නැලවිල්ල
(3) කපුයක්කාරිය
(4) රාමා මැරීම



29. මෙම නාට්‍ය ශිල්පිනිය විකෘති නාට්‍ය අධ්‍යක්ෂකවරියයි
(1) අමිතා රබිබිඩිගල
(2) සෝමලතා සුබසිංහ
(3) චාන්දනී සෙනවිරත්න
(4) කෞශල්‍ය ප්‍රනාන්දු



30. මෙම ගැමි නාටකය ප්‍රචලිතව ඇත්තේ,
(1) උඩරට ප්‍රදේශයේ
(2) පහතරට ප්‍රදේශයේ
(3) සබරගමු ප්‍රදේශයේ
(4) ලංකාවේමය



- **අංක 31 සිට 40 දක්වා ප්‍රශ්නවලට හිස්තැන් පුරවන්න**

31. මුහුණේ ඉරියව් මඟින් හැඟීම් ප්‍රකාශනය කිරීම ........................................................................ අභිනයයි.
32. ....................................... නාට්‍ය 1956 දී එදිරිවීර සරච්චන්ද්‍ර ශූරීන් විසින් නිෂ්පාදනය කරන ලදි.
33. ............................................ මඩු ශාන්තිකර්මයේ එන ඇතකු සම්බන්ධයෙන් කෙරෙන නාට්‍යමය අවස්ථාවකි.
34. ....................................................... හා ................................................... ලෙස නාට්‍ය වර්ග දෙකකි.
35. ....................................................... "ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත" යනුවෙන් ..................................... විසින් කියන ලදි.
36. දක්ෂිණ භාරතීය සංගීතය යොදා ගනිමින් ....................................................... රාත්‍රී ගණනාවක් මුළුල්ලේ රඟදැක්වුන රංග ශෛලියකි.
37. ඌරා යක්කම ....................................................... නම් වූ උඩරට ශාන්තිකර්මයේ එන නාට්‍යමය ලක්ෂනයකි.
38. පසුතල නිර්මාණය ....................................................... අභිනයට අයත් වේ.
39. නාට්‍යයක් සඳහා නළු නිලියන් තෝරා ගැනීම ....................................................... ලෙස හඳුන්වයි.
40. හනික වරෙව් කොල්ලනේ ගීතය අයත් ....................................................... නාටකය අධ්‍යක්ෂණය කළේ බන්දුල ජයවර්ධනයන්ය.

***** ****

# කැලණිය අධ්‍යාපන කලාපය
## දෙවන වාර පරීක්ෂණය
### නාට්‍ය හා රංග කලාව - 2016

11 ශ්‍රේණිය II

කාලය:- පැ. 2

නම:- ..............................................................................................................................

II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුළත්ව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

පහත ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඇන්නෑවේ මේ මල කෝලම්
පාරේ යන්නට බෑ මුන්දෑ සමඟින් //

මව්පියෝ නිදහස් වෙන්ට සිතාලා
(A) ...............................................
අඟටුමිටියා වුවාට සුන්දරියේ
නැද්ද හැඩරුව මං ..... ඇයි සුන්දරියේ නැද්ද හැඩරුව මං

(i) ඉහත ගීතය අයත් නාට්‍ය ශෛලිය කුමක්ද?
.............................................................................................................................

(ii) ඉහත ගීතය අයත් නාට්‍යයේ රචකයා කවුද?
.............................................................................................................................

(iii) ඉහත සඳහන් කාන්තාවට මුහුණදීමට සිදුවී ඇති සිදුවීම කුමක්ද?
.............................................................................................................................

(iv) මෙහි සඳහන් පිරිමි චරිතය හා කාන්තා චරිතයේ නම් මොනවාද?
.............................................................................................................................

(v) නාට්‍යයේදී මෙම දර්ශනය සඳහා ප්‍රධාන නළු නිළි දෙපලට අමතරව තව පිරිසක් සහභාගීවේද? වේ නම් ඒ කවුද?
.............................................................................................................................

(vi) මෙහි සඳහන් ස්ත්‍රිය ඒ පුරුෂයාට අකමැති වන්නේ ඇයි?
.............................................................................................................................

(vii) මෙම සංවාද ඛණ්ඩයේ "A" සම්පූර්ණ කරන්න.
.............................................................................................................................

(ලකුණු 12)

02. (i) නෘත්ත, නෘත්‍ය, නාට්‍ය යන්න උදාහරණ සහිතව නම් කරන්න. (ලකුණු 3)
(ii) නාට්‍යයට පමණක් සුවිශේෂි වූ අභිනයන් තිබේද? ඒවා නම් කරන්න. (ලකුණු 4)
(iii) සෙසු අභිනයන්ට වඩා ඒකී අභිනය නාට්‍යයට වැදගත් වන්නේ ඇයිදැයි උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

03. (i) ප්‍රාසාංගික කලාව යනු කුමක්ද? (ලකුණු 4)
(ii) ප්‍රාසාංගික කලාවන් අතර නාට්‍ය සුවිශේෂි වන හේතු 3 ක් ලියන්න. (ලකුණු 3)
(iii) ටෙලි නාට්‍ය හා නාට්‍ය කලාව අතර ඇති ප්‍රධාන වෙනස්කම් 3 ක් සඳහන් කර එසේ වීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 5)


04. (i) ශාන්තිකර්ම වලට අයත් නාට්‍යමය ලක්ෂණ 3 ක් නම් කරන්න. (ලකුණු 3)

(ii) මින් එක් නාට්‍යමය ලක්ෂණයක් උදාහරණ දෙමින් පහදන්න. (ලකුණු 4)

(iii) නාට්‍යයකත් ශාන්තිකර්මයෙත් එන නාට්‍යමය ලක්ෂණ වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 5)

05. (i) ශ්‍රී ලංකාවේ ජන නාටක කීයද? ඒ මොනවාද? (ලකුණු 3)

(ii)




ඉහත ඡායාරූපයේ A, B, C, D නම් කරන්න. (ලකුණු 4)

(iii) ඉහත රඟමඬල අයත් ජන නාටකයේ රංග ශෛලියේ සුවිශේෂිතා හඳුන්වන්න. (ලකුණු 5)

06. (i) ප්‍රධාන අංග රචනා විධි 2 ක නම් කරන්න. (ලකුණු 2)

(ii) එම දෙකෙහි ඇති සුවිශේෂිතා නම් කරන්න. (ලකුණු 4)

(iii) ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී අංගරචනවල වෙනස්කම් සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

07. (i) ක්ෂණික නිරූපනය යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) අභිරූපනය යන්න උදාහරණ සහිතව නිර්වචනය කරන්න. (ලකුණු 4)

(iii) චරිත නිරූපනය පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 4)

08. පහත සිදුවීම් උපයෝගී කරගෙන නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න. (අවශ්‍ය පරිදි චරිත යොදා ගත හැක) ශිෂ්‍යත්ව විභාගය සඳහා දෙමාපියන්ගේ දැඩි බලකිරීම මත කිසිදු නිදහසකින් තොරව වැඩකිරීමට සිදුවු ඉතා දක්ෂ සිසුවෙක් ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵලය ලෙස ලකුණු 0 ක් ලබාගනී.

(ලකුණු 12)

**** ****